*සැ. යු.* - 2008.02.22 දින පළකරන ලද අංක 1,538 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,539 - 2008 පෙබරවාරි මස 29 වැනි සිකුරාදා - 2008.02.29**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 214 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 214 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 217 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - සිරිනිවෙස් ප්‍රජාමිත්‍ර සහයෝගිතා කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2008 ජනවාරි මස 18 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2008, ජනවාරි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2008 ජනවාරි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීත් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීත් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 මාර්තු මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 පෙබරවාරි මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීම

රත්මලාන දුම්රිය අංගනයේ ඇති ගර්හිත වානේ/යකඩ අපහරණය කිරීම සඳහා මිල ගණන් කැඳවීම

01. කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, ප්‍රවාහන අමාත්‍යාංශයේ, කැබිනට් මණ්ඩල අනුමත ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, රත්මලාන දුම්රිය අංගනයේ ඇති ගර්හිත වානේ /යකඩ මෙ. ටො. 3,000 ක් (ආසන්න වශයෙන්) අපහරණය කිරීම සඳහා මිල දීමනාපත් භාරගනු ලැබේ.

02. 2008.03.14 දින ප. ව. 2.00 දක්වා මිල දීමනා පත් භාරගනු ලැබේ.

03. ආපසු නොගෙවනු ලබන රු. 5,000 ක මුදලක් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී කාර්යාලය වෙත ගෙවා කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් 2008.03.07 දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍රවල පමණක් මිල දීමනා ඉදිරිපත් කළ යුතුය.

04. මිල දීමනා පත් භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 01 හි පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශයේ දී මිල දීමනා පත් විවෘත කිරීම සිදු කෙරේ. එම අවස්ථාවට මිල දීමනාකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක.

05. මුද්‍රා තබන ලද මිල දීමනාපත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැක.

සභාපති, කැබිනට් මණ්ඩල අනුමත ප්‍රසම්පාදන කමිටුව, ප්‍රවාහන අමාත්‍යාංශය, අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී මිල දීමනා ආකෘති පත්‍ර නොමිලයේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩි විස්තර සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ, දුම්රිය ගබඩා අධිකාරී විමසන්න. දුරකථන අංක 94 (11) 2432044 හෝ 94 (11) 2436818.

සභාපති,
කැබිනට් මණ්ඩල අනුමත ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය.

යොමුව : එස්. ආර්. එස්/එෆ් 6638)

02-811

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

### 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ නම : ට්‍රස්ට් විංග්ස් (පෞද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 63037
සංස්ථාපනය කළ දිනය : 2008.02.13
සමාගමේ ලියාපදිංචි
කාර්යාලයේ ලිපිනය: අංක 09, දෙවැනි මහල, කන්සිස්ටර් බිල්ඩිම, අංක 96, මහ වීදිය, කොළඹ 11.

ජේ. ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම,
සමාගමේ ලේකම්.

02-863

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ ය.

සමාගමේ නම : ලලිත් ඇන්ඩ් ඇසෝෂියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය: පීවී 62965
ලියාපදිංචි ලිපිනය : අංක 104, ධර්මශ්‍රම මාවත, බොරුපන, රත්මලාන 10370.

අධ්‍යක්ෂ,
ආචාර්ය ලලිත් පින්තු ජයවර්ධණ.

02-893

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම

සමාගමේ නම : මවුන්ට් ස්ප්‍රින් වෝටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 62909
දිනය : 2008.01.31
ලියාපදිංචි ලිපිනය : මවුන්ට් ස්ප්‍රින් වෝටර් (ප්‍රයිවට්) ලිමිටඩ් අංක 110, කුමරන් රත්නම් පාර, කොළඹ 02.

බිස්නස්ටේම් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,

අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02,
2008 පෙබරවාරි මස 05 වැනි දින.

02-738

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008 ජනවාරි මස 18 දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : බිස්නස් සොලූෂන්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම

සමාගමේ අංකය : පී. වි. 62736
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 269 ඒ, අරලිය උයන, හෝකන්දර පාර, තලවතුගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එන්. එස්. කුමාරතුංග,
සමාගමේ ලේකම්.

02-776

---

### ඇටර්නි බලය අවලංගු කිරීම

කැනඩාවේ, පිකරිංහි පදිංචි වීරසිංහ ආරච්චිගේ අවලා ඉන්සානි වීරසිංහ වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එච්. පෙරේරා යන අය විසින් ලියා සහතික කරන ලද අංක 10147 දරන සහ 2006 දෙසැම්බර් මස 28 දිනැති ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාරව වීරසූරිය මුදියන්සේලාගේ චන්දන ගුණරත්න යන අයට ලබා දී තිබූ ඇටෝර්නි බලපත්‍රය 2008 පෙබරවාරි මස 04 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන බව ශ්‍රී ලාංකික ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ඒ. ඒ. අයි. වීරසිංහ.

02-773

---

### දැන්වීමයි

### 2007 අංක 07 දරන සමාගම් පනත

2007 අංක 07 දරන සමාගමේ පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබ ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ අංකය : පීවී 62777 දිනය 2008.01.23
සමාගමේ නම : හාබර් ලයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 25 1/1, වාලුකාරාම පාර, කොළඹ 03

එම්. අයි. පකීර් සයිබෝ,
අධ්‍යක්ෂ.

2008 ජනවාරි 13 වැනි දින.

02-831

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9(1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : බිලිටා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 62765
දිනය : 2008 ජනවාරි මස 21
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 08, මැදවැලිකඩ පාර, රාජගිරිය.

02-775

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සුප්‍රීම් පෙට්රෝලියම් ප්‍රයිවට් ලිමිටඩ් වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 08 වැනි දින සංස්ථාගත කරනු ලැබූ බවට වන සංස්ථාගත කරනු ලැබීමේ දැනුම් දීමයි.

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව සමාගමේ නාමය, සමාගමේ අංකය, සමාගමේ ලියාපදිංචි කාර්යාලය ලිපිනය පිළිබඳව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : සුප්‍රීම් පැට්‍රෝලියම් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලියාපදිංචි අංකය : පී. වී. 62606
සමාගමේ ලිපිනය : අංක 419/3/1, ගාලු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

පී. බී. එස්. සිරිවර්ධන,
(ලේකම්),

02-771

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

මින් තායි ලංකා ඇග්රෝ සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්, යන නමින් ලියාපදිංචි අංක පී. වී. 62729 යටතේ 2008.01.16 දින සමාගමක් ලියාපදිංචි කර ඇති බවත්, එහි ලියාපදිංචි කාර්යාලය අංක 24, වික්‍රමරත්න ඇවනිව්, කොහුවල, නුගේගොඩ යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන බවත් මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

පවිත්‍රා දිසානායක,
සමාගමේ ලේකම්,
මින් තායි ලංකා ඇග්රෝ සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.

2008 පෙබරවාරි මස 12 වැනි දින.

02-772

### 2007 අංක 7 දරන සමාගම් පනත දැන්වීමයි

සදර්න් මැරිටයිම් (ප්‍රයිවට්) ලිමිටඩ්
පීවී 62949

ඉහත සඳහන් සමාගම 2008 පෙබරවාරි මස 05 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය 28/1 ෂබ්රි ගාඩින්ස්, කොළඹ 4 යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමි.

බී. ඩී. ඕ. බිස්කොන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,
65/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 2.

2008 පෙබරවාරි මස 07 වැනි දින.

02-751

---

### 2007 අංක 7 දරන සමාගම් පනත දැන්වීමයි

ලංකා කොරුගේටඩ් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
පීවී 62925

ඉහත සඳහන් සමාගම 2008 පෙබරවාරි මස 01 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය, 11, මෝදරවිල ඉන්ඩස්ට්‍රියල් එස්ටේට්, පානදුර යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමි.

බී. ඩී. ඕ. බිස්කොන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,
65/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 2.

2008 පෙබරවාරි මස 07 වැනි දින,

02-750

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රාජගිරිය , නාවල ගල්පොත්ත පාරේ, රොඩ්රිගු ඇවනිව් අංක 24 දැනට 735 ඊස්ට් බාබරා ස්ට්‍රීට්, ටයිලර්, ටෙක්සාස් 75701, එක්සත් ජනපදයේ එම්එම්ඩීආර්14/01/2008 මනෝජා දනංජි රොඩ්රිගු වන මා විසින් රාජගිරිය, නාවල, ගල්පොත්ත පාරේ, රොඩ්රිගු ඇවනිව් අංක 24 හි පදිංචි චන්ද්‍රානි රූපානන්ද වීරකෝන් රොඩ්රිගු යන අයව මගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කරන ලද අංක 17310 සහ 1999.04.29 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙතැන් සිට අහෝසිකර අවලංගු කළ බවත් එකී චන්ද්‍රානි රූපානන්ද වීරකෝන් රොඩ්රිගු මගේ ඇටෝර්නි බලකාරිය නොවන බව ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයටත් සියලු ලක්වැසියන්ටත් මෙයින් දැනුම් දෙන අතර මගේ ඇටෝර්නි බලකාරිය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් මා වෙනුවෙන් නොවන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

එම්. එම්. ඩී. රොඩ්රිගෝ
එම්.එම්ඩීආර් 14.01.2008.

02-697

---

### 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ පහත සමාගම ලියාපදිංචි කරන ලදී

සමාගමේ නමः ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ලංකා) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීබී 3367 දිනය 2008.01.30
ලියාපදිංචි ලිපිනය : ඉටිගලවත්ත, කහඳව දකුණ, රන්න.

ඩීජී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-718

---

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1. සමාගමේ නම : හයිප්‍රොමැක් ෆැබ්රිකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 62893
3. සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 22/17, සර්කියුලර් පාර, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය
4. සංස්ථාගත කළ දිනය : 2008.01.31

සමාගමේ ලේකම්.

02-744

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008 ජනවාරි මස 28 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ෂුකර් ලංකා ඇපරල්ස් (පුද්ගලික) සමාගම

සමාගමේ අංකය : පී. වී.62829

ලියාපදිංචි ලිපිනය : අංක 168-1/6, 2 වැනි හරස් වීදිය, කොළඹ 11.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් ඩි, සොලිටියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

02-798/1

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008 ජනවාරි මස 21 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඉලන්ගරත්න එක්ස්පෝර්ට්ස් (පුද්ගලික) සමාගම

සමාගමේ අංකය : පී. වී.62771

ලියාපදිංචි ලිපිනය : අංක 07, දීගලාවතුර, දොරගමුව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් ඩි, සොලිට්යෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

02-798/2

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2007 නොවැම්බර් මස 27 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඊ. ටී, අයි. ඉලෙක්ට්‍රොනික් ලංකා කම්පැනි (පුද්ගලික) සමාගම

සමාගමේ අංකය : පී. වී.62168

ලියාපදිංචි ලිපිනය :වෙලේවත්ත, රම්බෑව, කනත්තවැව

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් ඩි, සොලිට්යෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

02-798/3

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වගන්තිය ප්‍රකාරවයි

1. සමාගමේ නම : රමෙයිකා ටෙක්නොලොජි සොලූයුෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ්
2. ලියාපදිංචි අංකය : පී. වී. 62772
3. ලියාපදිංචි ලිපිනය : අංක 247/1, හයිලෙවල් පාර, ජම්බුගස්මුල්ල, නුගේගොඩ.

සමාගමේ ලේකම්

02-875

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව - වෙන්නප්පුව ශාඛාව

1886 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

වෙන්නප්පුව අළුත්පාරේ කිඹුල්ගාල ක්‍රීඩාංගනයට යාබදව පිහිටි නිවසක් සහ වී මෝල් සංකීර්ණයක් සහිත වටිනා දේපළ විශාලත්වය අක්කර 02, රූඩ් 02, පර්චස් 17.6 මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ ම විසින් 2008.03.24 දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.04.12 දින ද, 'දිනමිණ', පුවත්පතේ 2002.03.27 දින ද, ඩේලි නිව්ස් පුවත්පතේ 2002.03.27 දින ද, 'තිනකරන්' පුවත්පතේ 2002.03.27 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මීගමුව හලාවත පාරේ වෙන්නප්පුව නගරයෙන් දකුණට ඇති අළුත් පාරේ (ලුණුවිලට යන පාර) සැ. 1ක් පමණ ගිය විට පාරේ වම්පස කිඹුල්ගාල ක්‍රීඩාංගනයට යාබදව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ප්‍රමාණයන් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අදිකාරි බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩිය පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253300/032-2253301 ෆැක්ස් අංකය: 032-2255247

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
වෙන්දේසිකරු, තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර,
මීගමුව.

දුරකථන අංක : 031-2223219, 031-2277518.

02-874

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0104400983.
ණයකරුගේ සම්පූර්ණ නම: තිළිණි තාරකා අමරසූරිය.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2008.01.18 වැනි දින අංක 1533 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2008.01.10 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න මයා විසින් 2008.03.18 වැනි දින පෙ. ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාර ලක්ෂ විසි එක් දහස් එකොළහයි ශත හතළිස් හතරක (රු. 421,011.44) මුදලක් වර්ෂ 2007.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තුන් ලක්ෂ හතළිස් දහස් හත්සිය හැත්තෑවයි ශත විසි එකක (රු. 340,770.21) මුදල ද, 2007.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් අසූ දහස් දෙසිය හතළිස් එකයි ශත විසි තුනක (රු. 80,241.23) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාර ලක්ෂ විසි එක් දහස් එකොළහයි ශත හතළිස් හතරක (රු. 421,011.44) ද,

(2) එකී රුපියල් තුන් ලක්ෂ හතළිස් දහස් හත් සිය හැත්තෑවයි ශත විසි එකක (රු. 340,770.21) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50% බැගින් වන පොලියක් 2007.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

බස්නාහිර පළාතේ. කොළඹ දිස්ත්‍රික්කයේ අඹතලෙන් පහළ කොටිකාවත්ත ග්‍රාමයෙහි පිහිටි මොරගහවත්ත නැමැති ඉඩමට 2000.02.19 දින කේ. ඒ. කපුගීකියන මානක තැන විසින් මැන සම්පාදිත අංක 2937 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම්, උතුරට: එම්. වීරක්කොඩි යන අයට අයත් ඉඩම ද, නැගෙනහිරට: ප්‍රධාන පාර දක්වා දිවෙන අඩි දහයක් පළල පාර ද, දකුණට: එම්. වීරක්කොඩි යන අයට අයත් ඉඩම ද, බටහිරට: ධර්මදාස යන අයට අයත් ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනක (අක්. 0 රූඩ් 0 පර්. 13) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බි 584/31 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

01-868

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0230000964.
ණයකරුගේ සම්පූර්ණ නම: සංගම උපාලි ඉන්ද්‍රජිත් .

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2008.01.25 වැනි දින අංක 1534 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2008.01.25 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත්

වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න මයා විසින් 2008.03.18 වැනි දින ප. ව. 1.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හැත්තෑ හය දහස් තුන්සිය හැටයි ශත හතළිස් තුනක (රු. 276,360.43) මුදලක් වර්ෂ 2007.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක් ලක්ෂ අනූ අට දහස් නවසිය අනූ අටයි ශත දහහතරක (රු. 198,998.14) මුදල ද, 2007.09.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් හැත්තෑ හත් දහස් තුන්සිය හැට දෙකයි ශත විසි නවයක (රු. 77,362.29) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙ ලක්ෂ හැත්තෑ හය දහස් තුන්සිය හැටයි ශත හතළිස් තුනක (රු. 276,360.43) ද,

(2) එකී රුපියල් එක් ලක්ෂ අනූ අට දහස් නවසිය අනූ අටයි ශත දහහතරක (රු. 198,998.14) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.40% බැගින් වන පොලියක් 2007.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරිපත්තුවේ වනවාසල ග්‍රාමයේ ගොරකගහවත්ත නැමැති ඉඩමට 1983.09.15 දින රත්න හෙට්ටිආරච්චි මානක තැන විසින් මැන සම්පාදිත අංක 220/1983 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම්, උතුරටː ආර්. එල්. වීරරත්නගේ ඉඩම ද, නැගෙනහිරට ː ජේම්ස් ප්‍රනාන්දුගේ ඉඩම සහ ලොට් 4 ද, දකුණටː ලෙට් 2 සහ 4 ද, බටහිරටː ආර්. ඒ. එස්. ඉදිරිසිංහගේ කුඹුර ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම බිංදුවයි තුනක් (අක්. 0 රූඩ් 0 පර්. 19.03) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතවාය ද සමග කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 442/200 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

01-869

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2400000192.
ණයකරුගේ සම්පූර්ණ නම: මල්ලවආරච්චිගේ මාලනී *හෙවත්* මාලා මල්ලවආරච්චි *හෙවත්* ආරච්චිලාගේ මාලා මල්ලවආරච්චි

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2007.11.02 වැනි දින අංක 1524 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2008.01.19 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න මයා විසින් 2008.03.17 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක් ලක්ෂ පනස් එක් දහස් නවසිය දහහතයි ශත විසි හතක් (රු. 151,917.27) මුදලක් වර්ෂ 2007.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑ දහස් තුන්සිය හැත්තෑවයි ශත අනූ හයක (රු. 70,370.96) මුදල ද, 2007.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් අසූ එක් දහස් පන්සිය හතළිස් හයයි ශත තිස් එකක් (රු. 81,546.31)ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක් ලක්ෂ පනස් එක් දහස් නවසිය දහහතයි ශත විසි හතක් (රු. 151,917.27) ද,

(2) එකී රුපියල් හැත්තෑ දහස් තුන්සිය හැත්තෑවයි ශත අනූ හයක (රු. 70,370.96) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.00% බැගින් වන පොලියක් 2007.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, දකුණු උඩ පත්තුවේ, රත්නපුර ප්‍රාදේශීය සභා සීමාවේ, කහන්ගම පිල්ලේගෙදර ග්‍රාමයෙහි පිහිටි දොඩම්ගහලියද්දේ හේන වත්ත නැමැති ඉඩමට 1990.05.11 දින එම්. ඩබ්ලිව්. රත්නායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 2812 පිඹුර ප්‍රකාර ලොට් 2 ට මායිම්, උතුරටː අඩි හයක් පළල පොදු පාර සහ ලොට් 3 ද, නැගෙනහිරː ලොට් 3 සහ 1 සහ දොඩම්ගහලියද්දේ කුඹුර ද, දකුණට ː ලොට් 1 සහ පිල්ලේගෙදර වත්ත ද, බටහිරට ː ලොට් 6 සහ 5 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිතුනයි දශම පහයි නමයක

(අක්. 0 රූඩ් 0 පර්. 23.59) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 635/110 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

01-872

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0303300242.
ණයකරුගේ සම්පූර්ණ නම: දිසානායක මුදියන්සේලාගේ අශෝක පුෂ්ප කුමාර දිසානායක

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2008.01.25 වැනි දින අංක 1534 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2008.01.25 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ මයා විසින් 2008.03.18 වැනි දින ප. ව. 2.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ දහහත් දහස් එකසිය තිහයි ශත විසිනවයක (රු. 217,130.29) මුදලක් වර්ෂ 2002.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑ හත් දහසක (රු. 77,000.00) මුදල ද, 2002.08.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක් ලක්ෂ හතලිස් දහස් එකසිය තිහයි ශත විසි නවයක (රු. 140,130.29), වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ දහහත් දහස් එකසිය තිහයි ශත විසිනවයක (රු. 217,130.29) ද,

(2) එකී රුපියල් හැත්තෑ හත් දහසක (රු. 77,000.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.00% බැගින් වන පොළියක් 2002.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### ඉහත සඳහන් දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ උතුරු කළුතර තොටමුනේ වාද්දු වස්කඩු දෙබාද්දේ කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ මොල්ලිගොඩ පිහිටි "කොරොස්දූව වත්ත" නැමැති ඉඩමට 1994.06.12 දින එන්. පී. ඇල්විටිගල මානක තැන විසින් මැන සැකසූ අංක 468 දරන පිඹුරේ ප්‍රකාර අංක 40 දරන කොටසට මායිම් උතුරට: කැබලි අංක 41 සහ 74 ද, නැගෙනහිරට ፡ කැබැලි අංක 41 හා පාරක් සඳහා වෙන් කර ඇති කැබැලි අංක 34 ද, දකුණට: කැබලි අංක 39 සහ බස්නාහිරට ፡ කැබැලි අංක 39 සහ 74 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (අක්. 0 රූ. 0 පර්. 15) විශාල ඉඩම මාර්ග පරවශතාවය ද සමග වේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 74/322 103/240, 242 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

01-870

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0300001326.
ණයකරුගේ සම්පූර්ණ නම: වනිගරත්න ජයසේකර ලීලාවතී

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2005.08.19 වැනි දින අංක 1407 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2008.01.25 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු

ඒ. එස්. ලියනගේ මයා විසින් 2008.03.18 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් විසි දෙදහස් දෙසිය හතරයි ශත විසි දෙකක (රු. 22,204.22) මුදලක් වර්ෂ 2003.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපල උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දහසය දහස් දෙසිය හැට හයයි ශත හතළිහක (රු. 16,266.40) මුදල ද, 2003.06.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පන් දහස් නවසිය තිස් හතයි ශත අසූ දෙකක් (රු. 5,937.82) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් විසි දෙදහස් දෙසිය හතරයි ශත විසි දෙකක (රු. 22,204.22) ද,

(2) එකී රුපියල් දහසය දහස් දෙසිය හැට හයයි ශත හතළිහක (රු. 16,266.40) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොළියක් 2003.07.01 දින සිට දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ බේරුවල ප්‍රාදේශීය සභාවේ මග්ගොන බද්ද උප කාර්යාලයේ මුංහේන ග්‍රාමයේ හි පිහිටි සිංහලදෙනියේලන්ද සහ සිංහලදෙනිය කැලේ නැමැති ඉඩමට 1998.08.20 දින වයි. පි. ද සිල්වා මානක තැන විසින් මැන සම්පාදිත අංක 820 පිඹුර ප්‍රකාර ලොට් 110 ට මායිම්, උතුරට: ලොට් 13 (අඩි 20 පාර) සහ ලොට් 1 (පාර පුළුල් කිරීම සඳහා වූ රක්ෂිතය ද, නැගෙනහිරට: ලොට් 111, ලොට් 112 ද, දකුණට : මු. පි. 15906 හි ලොට් 3 ද, බටහිරට : පාර ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතක් (අක්. 0 රූ. 0 , පර්. 17) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද, සමග කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 213/180 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2008ක් වූ පෙබරවාරි, මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

01-871

---

### රුහුණ සංවර්ධන බැංකුව - මාතර නගර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2008.03.18 දින පෙ.ව. 10.30ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර තුළ නාවිමන පිහිටි දැලිඅද්දරවත්ත *හෙවත්* කෝන්ගහවත්ත පිටකොරටුව නැමති ඉඩම බලය ලත් මිනින්දෝරු ජේ. පී. අමදෝරු මහතා විසින් මැන සාදන ලද අංක 2 දරන පර්චස් හතයි දශම තුනයි පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 7.35) ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු වැවිලි හා ගොඩනැගිලි ද වේ.

වැඩි විස්තර සඳහා 2006.08.09 දින *රජයේ ගැසට් පත්‍රය ද*, 2007.12.11 දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත් වල ද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම*.- මාතර, තංගල්ල පාරේ වෙලේවත්ත හන්දියට පැමිණ එතැනින් වම්පසට වැටී ඇති නාවිමන පාරේ නාවිමන හන්දිය දක්වා පැමිණ එතැනින් වමට හැරී මීටර් 750ක් පමණ ගියවිට හමුවන වෙල්ලමුල්ල හන්දියෙන් ගුරුපාර දිගේ මීටර් 100ක් පමණ ගියවිට පාරේ දකුණු පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් විකුණුම් මිලෙන් 21/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ, අංක 382ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතාට ගෙවිය යුතුය. ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208,2226209,2225963

ජී. පී. ආනන්ද (සාමවිනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර
දුරකථන අංක : 041-2228731

02-704

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - බුත්තල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දාවූ 1998.07.01 දින සහ අංක 5966 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේකෝන් මුදියන්සේලාගේ සෝමවතී සහ බණ්ඩාරනායක හේරත් මුදියන්සේලාගේ ඉන්ද්‍රජිත් රෝහණ කුමාර කටුගහ ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේදී 2008 මාර්තු මස, 18 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කොට්ඨාසයේ බුත්තල කෝරළේ ඔක්කම්පිටිය ගමේ පිහිටි පංගුවේවත්ත නමැති බෙදූ ඉඩමට බලයලත් මානක එම්. සමරසේකර විසින් මැන සාදන ලද 1989.10.14 දිනැති අංක 1557 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටස.

විශාලත්වය .- රූඩ් 03යි පර්චස් 29 යි

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.11.30 දින *රජයේ ගැසට් පත්‍රය* හා 2007.12.04 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාල ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. කොළඹ 10 ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකාරු (ණය අයකිරීම්).

දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

02-848

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - බුත්තල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් සහතික කරන ලද්දාවූ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන් ලද්දාවූ 2003.07.08 දින සහ අංක 828 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මහලක්ෂ මුදියන්සේලාගේ චන්ද්‍රාවතී සහ රණසිංහ අරච්චිලාගේ සනත් සිසිර කුමාර ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේදී 2008 මාර්තු මස 17 වැනි දින ප. ව. 2.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ වරුණගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වීරසේකර ගමේ පිහිටි බලයලත් මානක ඩබ්ලිව්. විල්මට් සිල්වා විසින් මැන සාදන ලද 2000.07.16 දිනැති අංක 1308 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට්2 දරන ඉඩම් කොටස.

විශාලත්වය .- අක්කර 1 යි, රූඩ් 2 යි

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.11.30 දින *රජයේ ගැසට් පත්‍රය* හා 2007.12.04 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාල ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. කොළඹ 10 ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකාරු (ණය අයකිරීම්).

දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

02-849

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බුත්තල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියනලද්දා වූ 2004.12.01 දින සහ අංක 12887 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හේවාකාසි කංකානම්ගේ සෝමලතා සහ සිසිර මධුරප්පෙරුම ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේදී 2008 මාර්තු මස 17 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ. මොණරාගල දිස්ත්‍රික්කයේ. බුත්තල කෝරළේ පෙට්ටගන්වෙල ගමේ පිහිටි පෙට්ටගන්වෙල හේන් යාය නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක අයි. කොටඹගේ විසින් මැන සාදන ලද 1997.03.06 දිනැති අංක 1851 දරන පිඹුරේ ලොට් 1 ලෙස සලකුණු කරන ලද ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ.

විශාලත්වය පර්චස් 2.53 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.11.30 දින *රජයේ ගැසට් පත්‍රය* හා 2007.12.04 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000) ක් ද වේ.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාල ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකාරු (ණය අයකිරීම්) ගෙන් ලබාගත හැක.

දුරකථන අංක : 2661815, 2661816.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

02-847

---

## සෙලාන් බැංකුව පීඑල්සී - කටුනේරිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළේ, ඕතර පළාතේ, බන්දිරිප්පු ගමේ පිහිටි මිනුම්පති විසින් සාදන ලද පී. පී. පී. යූ 2241 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පාතිමා වත්ත නැමැති ඉඩමේ අංක 39 ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටස ප්‍රමාණයෙන් හෙක්ටයාර් දශම එකක් (හෙක්ටයාර් 0.100) විශාල ගොඩනැගිලි ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව එල්. ඩී. ඕ. පුන්/වෙන්/45/43 හි ලියාපදිංචි කර ඇත.

පෙර කී ඉඩම මැනක කරන ලද මිනුම් සැලැස්මක් අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, දකුණු පිටිගල් කෝරළේ, ඕතර පළාතේ, බන්දිරිප්පු ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ෂෙල්ටන් සමරතුංග විසින් සාදන ලද 2003.03.16 දිනැති අංක 5491 දරන සැලැස්මේ පෙන්නුම් කරන පාතිමා වත්ත නමැති ඉඩමේ අංක 01 ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තිස් නමයයි දශම බිංදුවයි පහක් (පර්. 39.05) විශාල ඉඩම් ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

මෙම දේපල ලුනුවිල පදිංචි ජයසිංහ ආරච්චිගේ සම්පත් ජයශාන්ත ජයසිංහ යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2008 මාර්තු මස 27 වැනි දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.* - ලුණුවිල නගර මධ්‍යයේ සිට බොරලැස්ස පාරේ කි. මී. 1.4ක් ගිය විට දකුණට ඇති පාතිමා පාරේ මීටර් 300ක් ගිය විට හමුවන ඩොනල්ඩ් ගේ නිවස ඉදිරිපිට වමට ඇති බොරලු පාරේ මීටර් 100ක් ගිය විට පාරේ වම් පස ඉඩම පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2007.06.01 වැනි දින ද ලංකාදීප සහ ඩේලිමිරර් යන පුවත්පත්වල 2007.05.03 වැනි දින ද, වීරකේසරි පත්‍රයේ 2007.05.16 වැනි දින ද පළ වි ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10%ක් (සියයට දහයක්) 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500. 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුවට පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456285, 3456263, 2456284

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්, තක්සේරුකරු.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-2696155, 011-2572940

02-862